# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2153/18 - 2019 දෙසැම්බර් මස 12 වැනි බ්‍රහස්පතින්දා - 2019.12.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වන ව්‍යවස්ථාවේ (13)(ආ) අනුව්‍යවස්ථාව යටතේ පුරප්පාඩුවක් පිරවීම**

අංක 21 - රත්නපුර මැතිවරණ කොට්ඨාසය සඳහා 1988 අංක 15 දරන පනතින් සංශෝධිත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 62 වන වගන්තිය යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද බව ප්‍රකාශයට පත්කරන ලද **තිරිමාදුර රංජිත් ද සොයිසා** මහතා මියයාම හේතුකොට ගෙන අටවන පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව, ඉහත කී පනතේ 64(1) වන වගන්තිය යටතේ පාර්ලිමේන්තුවේ මහලේකම් විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇති හෙයින් ද,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වන ව්‍යවස්ථාවේ (13)(ආ) අනුව්‍යවස්ථාව යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි මෙම පුරප්පාඩුව පුරවන ලෙස එකී මන්ත්‍රීවරයා තෝරා පත්කර ගන්නා ලද මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරියාට 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(1) වන වගන්තිය යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් විධාන කරනු ලැබූ හෙයින් ද,

තේරීම්භාර නිලධරයා විසින් එකී පනතේ 64(2) වන වගන්තිය යටතේ ක්‍රියාකරමින් එකී මැතිවරණ කොට්ඨාසය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස **උඩගම ලියනගේ වරුණ ප්‍රියන්ත ලියනගේ** මහතා තෝරා පත්කරන ලද බව ප්‍රකාශයට පත්කර, එම පනතේ පළමුවන උපලේඛනයේ ''ක'' ආකෘතිය මත, මැතිවරණ කොමිෂන් සභාවට වාර්තාව ඉදිරිපත් කොට ඇති හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනවවැනි සංශෝධනයේ විධිවිධාන සමග කියවිය යුතු 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(2) වන වගන්තියෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් ඉහත කී **තිරිමාදුර රංජිත් ද සොයිසා** මහතා මියයාම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව පිරවීම පිණිස අංක 21 - රත්නපුර මැතිවරණ කොට්ඨාසය සඳහා අටවන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු ලෙස **උඩගම ලියනගේ වරුණ ප්‍රියන්ත ලියනගේ** මහතා තෝරාපත් කර ගන්නා ලද බව මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| මහින්ද දේශප්‍රිය | එන්. ජේ. අබේසේකර | එස්. රත්නජීවන් එච්. හූල් |
| සභාපති | සාමාජික | සාමාජික |
| මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කොමිෂන් සභාව |

2019 දෙසැම්බර් මස 12 වැනි දින,
රාජගිරිය,
මැතිවරණ කොමිෂන් සභාවේ දී ය.


1A - G 31477 — 392 (2019/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*